# සංක්ෂිප්තය

ගණිතය ඉගෙනීම කෙරෙහි බැඳුණු සාධක කිහිපයක් ගණිත සාධනයට දක්වන සම්බන්ධයේ ස්වභාවය පිළිබඳ විස්තරාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයට යොදා ගත් ගැටලුවයි. ගණිත එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය ම විෂයයකි. ශ්‍රී ලංකාව තුළ නම් උසස් අධ්‍යාපනයට පිවිසීමට මෙන් ම රැකියාවක් සොයා ගැනීමටත් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය සමත්වීම අත්‍යවශ්‍ය වේ.

මෙම පර්යේෂණයේ දී අරමුණු පහක් යටතේ තොරතුරු රැස් කර ගෙන ඇත. සිසුහු ගණිත විෂයය පිළිබඳ විවිධ ආකල්ප දරති. ගණිතය ඉගෙනීමට පහසු සරල විෂයයක් ලෙස සිතන පිරිසක් මෙන් ම ඉගෙනීමට අපහසු සංකීර්ණ විෂයයක් ලෙස සිතන සිසු පිරිසක් ද සිටිති. මේ නිසා ගණිතය පිළිබඳ සිසු ආකල්පය පරීක්‍ෂා කරන ලදී. තම ගණිත හැකියාව පිළිබඳ දරණ අදහස එනම් තම ගණිත හැකියාව පිළිබඳ දක්වන ස්වසංකල්පය හා එය ගණිත සාධනයට දක්වන සම්බන්ධයත් පරීක්ෂා කරන ලදී. බටහිර රටවල කරන ලද පර්යේෂණ මගින් සොයා ගෙන ඇත්තේ අධ්‍යාපනික කාර්ය සාධනයත් ස්වසංකල්පයත් අතර ධනාත්මක සහසම්බන්ධයක් බවයි. නමුත් ශ්‍රී ලංකාව වැනි පෙරදිග සෘටක දී එය එලෙසම වේ. යැයි බලාපොරොත්තු විය නොහැකිය මේ නිසා එය පර්යේෂණයට ඇතුළත් කෙරිණි. ස්ත්‍රී පුරුෂ බව අනුව ගණිත පිළිබඳ ස්වසංකල්පයේ වෙනසක් තිබේදැයි පරීක්‍ෂා කරන ලදී. ගණිතය වියුක්ත සංකල්පමය විෂයයක් නිසා එය වෙනත් පුද්ගලයකුගෙන් ම ඉගෙන ගත යුතු ය. මේ නිසා ගණිත ගුරුවරයාගේ ඉගැන්වීම් විලාසය පිළිබඳ ආකල්පය මෙන්ම එය සාධන මට්ටම කෙරෙහි දක්වන සම්බන්ධයත් තම යහළුවන් අතර තමාගේ ගණිත හැකියාව පිළිගැනීමට ලක්වීම පිළිබඳ ආකල්පයත් එය ගණිත සාධනයට දක්වන සම්බන්ධයත් පරීක්ෂා කෙරුණි.

6-11 ගණිත විෂයය ප්‍රධාන තේමා හයක් යටතේ විෂය ඒකකවලට බෙදා ඉගැන්වීම් කටයුතු සිදු කරයි. එම තේමා වලට ඇති කැමැත්ත විමසා බැලීමත් ස්ත්‍රී පුරුෂ බව අනුව එම කැමැත්තේ වෙනසක් තිබේ යන්නත් මෙහිදී පරීක්‍ෂා කෙරුණි.

මෙම පර්යේෂණය සඳහා හොරණ අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන කොට්ඨාස තුනෙන් එකොළොස් වැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වෙන පාසල් හතර බැගින් තෝරා ගන්නා ලදී. 1AB ජාතික පාසල්, 1AB ජාතික නොවන පාසල්, 1C පාසල්, 2 වර්ගයේ පාසල් ලෙස කොට්ඨාස

තුනෙන් පාසල් 12 ක් තෝරා ගන්නා ලදී. එක් පාසලකින් ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් හතක් බැගින් සිසුන් 168 ක නියැදියක් තෝරා ගන්නා ලදී.

මෙහි දී ආකල්ප පරිමාණයක් සහ 2006 වසරේ බස්නාහිර පළාතේ ඇගයීමේ ගණිතය ප්‍රශ්න පත්‍රය මගින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී

ගණිතය පිළිබඳ ස්වසංකල්පය හා ගණිත සාධන මට්ටම අතර සම්බන්ධයක් නොමැති බවත් ස්ත්‍රී පුරුෂ බව අනුව ගණිතය පිළිබඳ ස්වසංකල්පයේ කැපී පෙනෙන වෙනසක් නොමැති බවත් ගණිත ගුරුවරයාගේ ඉගැන්වීම් විලාසය පිළිබඳ ආකල්පය මෙන් ම තම යහළුවන් අතර තම ගණිත හැකියාව පිළිගැනීමට ලක්වීම ගණිත සාධනයට සම්බන්ධයක් නොමැති බවත් ගණිතයේ ප්‍රධාන තේමා හයට සිසුන් දක්වන කැමැත්ත යහපත් බවත් එම තේමා හයට ඇති කැමැත්ත ස්ත්‍රී පුරුෂ බව අනුව කැපී පෙනෙන වෙනසක් නො දක්වන බවත් සොයා ගැනුනි.

පර්යේෂණය අවසානයේ විෂය සංවර්ධනය සඳහා යෝජනා මෙන් ම අනාගත පර්යේෂණ අවස්ථා මග පෙන්වීම ද කර ඇත .